# 2 ඒකකය

# ආදි මිනිසා

## 1 - පාඩම

**පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළතුරු සපයන්න.**

අප ජීවත් වන පෘථිවියෙහි ආරම්භය මීට අවුරුදු මිලියන හාරදහස් පන්සිය හතලිහක් පමණ ඉහතදී අහසේ තිබුණු දූවිලි වලාවකින් සෑදුන බව පොදු විශ්වාසයයි. එම දූවිලි වලාව නිහාරිකාවක් ලෙස හඳුන්වයි. ඉංග්‍රීසි පොත් වල නෙබියුලා (NEBULA) ලෙස හඳුන්වා ඇත.

එය $6000^0$C පමණ වූ අධික උෂ්ණසුමකින් යුක්ත විය. පසුව ක්‍රමයෙන් සිසිල් වුවත් පෘථිවි අභ්‍යන්තරය ( ඇතුලත) තවමත් අධික උෂ්ණසුමකින් යුක්තයි. තවමත් ගිනිකඳු පුපුරන විට ලාවා ලෙස මතු පිටට ගලා එන්නේ පෘථිවිය ඇතුලත ඇති ඒ අධික උෂ්ණසුම් දේවල්ය.

එසේ පෘථිවිය සෑදී තවත් අවුරුදු මිලියන දෙදහස් පන්සියයකින් පමණ පසුව ජීවීන් බිහිවූ අතර මුලින්ම බිහි වූ ජීවියා ප්‍රොකායෝට් බැක්ටීරියාවයි. මීට අවුරුදු මිලියන පන්සිය හතලිස් දෙකකට පෙර ජීවත් වූ සතකුගේ සළකුණක් කැනඩාවෙන් සොයාගෙන ඇත. එම සතා මුහුදු පතුලේ ජීවත් වී ඇති අතර ඔපබිනියා ලෙස හඳුන්වා ඇත. එම සතාගේ ශරීර ලක්ෂණ,

- 4cm ත් 7cm අතර දිගයි
- ආහාර ගැනීමට මුඛයක් ඇත.
- ඇස් 5ක් පිහිටා ඇත.

- එලෙස ලෝකයේ මුල්ම ජීවියා ජලයේ බිහිවූ අතර අවුරුදු මිලියන හාරසිය විස්සකට පෙර සිලූරියන් නමින් හැඳින්වෙන යුගයේදී ගොඩබිම පහල වූ මුල්ම ජීවියා පාද කිහිපයක් ඇති හැකරල්ලා වැනි සතෙකුය.
- ගොඩබිමට මුලින්ම පැතිර ගියේ සතුන් නොව ශාකයි. එය මීට අවුරුදු මිලියන පන්සිය හතලිස් දෙකකට පෙර පේලියෝසොයික යුගයේදීය. මිනිසා බිහිවූයේ ඊට බොහෝ කළකට පසුය.

## ක්‍රියාකාරකම - 1

**ඡේදය කියවා පහත වාක්‍ය වල හිස්තැන් සම්පූර්ණ කරන්න**

1. අප ජීවත්වන පෘථිවියෙහි ආරම්භය මීට අවුරුදු මිලියන .................................... පෙර සිදුවී ඇත.
2. පෘථිවිය සෑදෙන්නට ඇතැයි විශ්වාස කෙරෙන දූවිලි වලාව .................................. නැතහොත් ......................... නමින් හැඳින්විය.
3. අප ජීවත් වන පෘථිවිය අභ්‍යන්තර (ඇතුලත) .......................................... උෂ්ණත්වයකින් යුක්ත වේ.

**පහත සඳහන් ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.**

1) පෘථිවිය නිර්මාණය වීමෙන් පසු බිහිවූ පළමු ජීවයක් සහිත දෙය හඳුන්වන නම කුමක්ද?

2)

a) අවුරුදු මිලියන පන්සිය හතලිස් දෙකකට පෙර ජීවත් වූ සත්ත්වයා සොයාගත් රට කුමක්ද?
b) එම සතා හැඳින්වූ නම කුමක් ද?
c) එම සතාගේ ලක්ෂණ තුනක් සඳහන් කරන්න

3) පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| කාලය අවුරුදු මිලියන | යුගය හැඳින්වූ නම | සොයා ගැනීම |
|---|---|---|
| 1. අවුරුදු මිලියන 420කට පෙර | | |
| 2. අවුරුදු මිලියන 542කට පෙර | | |

**2 - පාඩම**

# ආදි මිනිසාගේ විකාශනය

- මිනිසා යනු ස්වභාවධමර් සත්ත්වයෙකි. මිනිසා වෙනත් සතුන්ට වඩා ඉදිරියෙන් සිටින අතර ඒ බවට සාධක ඇත.
    - නොයෙක් දෑ තැනීමේ හැකියාව. (තාක්ෂණය)
    - අදහස් හුවමාරු කර ගැනීමේ හැකියාව - (භාෂාව)
    - සෞන්දර්යාත්මක හැකියාව - (කලාව) නැටීම හා ගැයීම
- මිනිසා බිහිවී ඇත්තේ මානව පරිණාමය තුළිනි
    - වානර පරම්පරාවෙන් ආරම්භ විය.
    - මීට අවුරුදු මිලියන දෙක හමාරකට පමණ ඉහතදී අධික ශීතල පැවති යුගයක් විය. එය මහා හිම යුගයයි.එම කාලයේ අප්‍රිකාවේ ජීවත් වූ චිම්පන්සියෙකු නෑදෑයන්ට වඩා වෙනස් ලක්ෂණ පෙන්වන්නට විය. ඒවා නම්,
        - දත්වල හා මුහුනේ වෙනස්කම්
        - පාද දෙකෙන් ඇවිද යාමේ ඇති හැකියාව
        - ඉදිරි පාද දෙකෙන් යමක් අල්ලන්නට ඇති හැකියාව
        - නුපුරුදු ආහාර ගැනීම

මෙම ලක්ෂණ ඇති වී මිනිසෙකුගේ ලක්ෂණ ඇති විය. මෙම ක්‍රියාවලිය මානව පරිණාමය ලෙස හැඳින්වීය.

- වානරයින්ට වඩා මිනිසා තුළ දැකිය හැකි වූ ලක්ෂණ කිහිපයකි.
    - උපකරණ පාවිච්චි කිරීම
    - රවුම් හැඩ ගල් වලින් ඇට වගී තලා (කැකුණ ඇට) මද ආහාරයට ගැනීම ආදියයි.

මෙවැනි මිනිසෙකුගේ හැඩරුවක් ඇති පැරණිතම වානරයා **ඔස්ට්‍රලෝපිතිකස්** යන නමින් හැඳින්වීය.

- වානර පවුලකින් මානව පරම්පරාවක් බිහිවීමට බලපෑ ප්‍රධාන හේතුවක් වූයේ මහා හිම යුගයේ පැවති දේශගුණයයි.

- මහා හිම යුගයේ අධික ශීතල කාල හතරක් හා කෙටි උණුසුම් කාල හතරක් තිබුණි.උණුසුම් කාලයේදී ආහාර සුලභ විය. මහා හිම යුගයේදී මැමත් අලි ජීවත් විය.

<u>මානව වර්ග හා ඔවුන්ගේ ක්‍රියාකාරකම්</u>

| | මානව වර්ගය | ජීවත් වූ කාලය | හැඩය /රූපය | | ක්‍රියාකාරකම් / ලක්ෂණ |
|---|---|---|---|---|---|
| | වානර චිම්පන්සියා | මීට අවුරුදු මිලියන දෙකහමාරකට ඉහත | | | ▪ දත්වල හා මුහුනේ වෙනස්කම් ඇතිවීම<br>▪ ඉදිරි පාද දෙකෙන් යමක් අල්ලා ගැනීමට හුරුවීම<br>▪ නුපුරුදු ආහාර ගැනීම |
| 1 | මුල්ම මානවයා ඔස්ට්‍රලෝපිතිකස් | |  |  | ▪ පාද දෙකෙන් ඇවිද යාමේ හැකියාව<br>▪ ඇට වර්ග රවුම් ගල් වලින් තලා මද ආහාරයට ගැනීම (කැකුණ වැනි ඇට වර්ග) |
| 2 | හෝමෝ හැබිලස් ( හැකි මිනිසා) | මීට අවුරුදු මිලියන 2.3ත් 1.4ත් අතර කාලයේ |  |  | ▪ ගලකින් ගලකට ගසා පතුරක් කඩා ඉවත් කර මුවහත් මුහුනතක් සාදා ගෙන මෙවලම් තැනීම.<br>▪ ගල් මෙවලම් තැනීමේ ආරම්භය. |
| 3 | හෝමෝ ඉරෙක්ටස් | මීට අවුරුදු මිලියන 1.8කට ඉහත |  |  | ▪ ගින්දර සොයා ගැනීම (ගලකින් ගලකට ගසා)<br>▪ ගින්දර සොයා ගත්තේ පළමුව ඊශ්‍රායලයෙනි.<br>▪ ආහාර පුළුස්සා ගැනීමට යැකි විය. (මස් වර්ග, අල වර්ග ආදිය)<br>▪ ශරීරයේ හැඩය අලංකාර විය. |
| 4 | හෝමෝ නියන්ඩතාලන්සිස් | මීට අවුරුදු හය ලක්ෂයකට පෙර |  |  | ▪ ක්‍රමයෙන් මොලය දියුණු විය. (වානරයකුගේ මොළයට වඩා විශාලයි)<br>▪ ඉතා හොඳ දඩයක්කාරයෙකි.<br>▪ විශාල සතුන්ගේ ඇටකටු භාවිතාකර නිවාස තැනීය<br>▪ එළවළු වර්ග පිස ආහාරයට ගත්හ. |
| 5 | හෝමෝ සාපියන් (වර්තමාන මානවයා) | |  |  | ▪ මොළය හොඳින් වැඩී තිබීම.<br>▪ අදහස් හුවමාරු කර ගැනීමට භාෂාව වර්ධනය වී තිබීම.<br>▪ හැඟීම් ප්‍රකාශ කිරීමේ හැකියාව (සංගීතය,නැටුම්, චිත්‍ර)<br>▪ සතකුගේ ඇට කැබැල්ලකින් බට නලාවක් නිපදවා ඇත. |

## ක්‍රියාකාරකම - 2

**පහත සඳහන් වාක්‍යවල හිස්තැන් සම්පූර්ණ කරන්න.**

1. මිනිසා බිහිවී ඇත්තේ ..................................... පරම්පරාවකිනි.
2. මිනිසාගේ බිහිවීම මීට වසර මිලියන ................................. කට පමණ ඉහතදී සිදු වී ඇත.
3. මීට අවුරුදු මිලියන දෙක හමාරකට පමණ ඉහත අධික ශීතල පැවති කාලය ................................ නමින් හැඳින්වෙයි.

**පිළිතුරු සපයන්න**

4. මිනිසාගේ අනෙක් සතුන්ට වඩා ඉදිරියෙන් සිටින බවට හඳුනාගත හැකි කරුණු දෙකක් සඳහන් කරන්න.
5. මිනිසාගේ හැඩරුව ඇති පැරණිතම මිනිසා හැඳින්වූ නම කුමක්ද?
6. මහා හිම යුගයේදී ජීවත් වූ සත්ත්ව වර්ග දෙකක් නම් කරන්න.
7. පහත "අ" තීරුව හා "ආ" තීරුව ගැලපෙන සේ යා කරන්න.

| "අ" තීරුව | "ආ" තීරුව |
|---|---|
| 1. හෝමෝ ඉරෙක්ටස් | a) ඇට වර්ග තලා ආහාර ගැනීම |
| 2. ඔස්ට්‍රලෝපිතිකස් | b) නූතන දියුණු මිනිසා |
| 3. හෝමෝහැබිලස් | c) විශාල සතුන්ගේ ඇටකටු වලින් නිවාස තැනීම |
| 4. හෝමෝසාපියන් | d) ගල් මෙවලම් තැනීම |
| 5. හෝමෝනියන්ඩතාලන්සිස් | e) ගින්දර සොයා ගැනීම |

**3 පාඩම**

## සංස්කෘතික දියුණුව

- චිම්පන්සියෙකුව සිට මිනිසෙකු දක්වා තමන්ගේ ශරීරය හා මොලය දියුණු කරගත් මිනිසා ජීවත්වන ආකාරයේ ඇති කරගත් වෙනස සංස්කෘතික වෙනස් වීම ලෙස හැදින්විය හැකියි.
- කාලයත් සමග මිනිසාගේ වෙනස්කම් වලට භාජනය වූ අංග නම්
  - ගල් මෙවලම්
  - වාසස්ථාන
  - ආහාර
- මේවා අතරින් මිනිසාගේ සංස්කෘතික දියුණුව ඇති වූ ආකාරය සොයා බැලීමට වැදගත් වන්නේ මිනිසා භාවිත කළ මෙවලම් වල ස්වරූපය අනුව සංස්කෘතික දියුණුව ප්‍රධාන අවධි 3කට බෙදා ඇත.

1. පුරාශිලා යුගය
2. මධ්‍ය ශිලා යුගය
3. නව ශිලා යුගය

**මෙම යුගවල ලක්ෂණ**

| පුරා ශිලා යුගය | මධ්‍ය ශිලා යුගය | නව ශිලා යුගය |
|---|---|---|
| • මිනිසුන් කණ්ඩායම් ලෙස එළිමහනේ තැන් තැන් වල ජීවත් විය.<br>• කණ්ඩායමක සාමාජිකයින් 20 – 30ත් අතර විය.<br>• අවමංගල චාරිත්‍ර ලෙස ඇට සැකිලි මත වර්ණ ආලේප කිරීම සිදු විය. (ගුරු ගල්)<br>• භාණ්ඩ හුවමාරුව තිබුණි.<br>• ජීවනෝපාය වූයේ දඩයම හා තැන තැන ඇවිද ආහාර එකතු කිරීමයි.<br>• අවසාන කාලයේ චිත්‍ර ඇඳීම හා ගල්වල රූප ඇඳීම කරන ලදී. | • මීට අවුරුදු 18000ත් 20000ත් අතර කාලයයි.<br>• දඩයමින් හා ආහාර එකතු කරමින් ජීවත් වූහ.<br>• දුණු ඊතල භාවිතය ආරම්භ විය.<br>• එක තැනක දිගු කාලයක් ජීවත් වීමට පුරුදු විය.<br>• දැව දඬු හා කොළ අතු භාවිතයෙන් නිවාස තනන ලදී.<br>• ගල් පර්වත මත චිත්‍ර අඳින ලදී.<br>• පුරා ශිලා යුගයට වඩා දියුණු ලක්ෂණ තිබුණි. | • මීට අවුරුදු 9000කට ඉහත යුගයයි.<br>• ගොවිතැනට පුරුදු වීම හා තිරිඟු, බාර් ලි, වී කුරක්කන් වගා කිරීම.<br>• සතුන් ඇතිකර මස්, බිත්තර, ලොම් ආදිය ගත්හ.<br>• ගල් මෙවලම් වෙනුවට ලෝහ මෙවලම් භාවිතා කළහ.<br>• ගම්මාන බිහි විය.<br>• දෙවියන් ඇදහීම ආරම්භ විය.<br>• ආගමික කටයුතු වලට නැඹුරු විය. |

**<u>ක්‍රියාකාරකම - 3</u>**

1. මිනිසාගේ සංස්කෘතික දියුණුවේ ප්‍රධාන අවධි තුන නම්කරන්න.
2. එම එක් එක් අවධිවල මිනිසා ලබාගත් ජයග්‍රහණ දෙක බැගින් සඳහන් කරන්න.
3. එම ජයග්‍රහණ දැක්වෙන චිත්‍ර ඇතුලත් කොට බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරන්න.

## <u>4 - පාඩම</u>

## <u>ගොවිතැන ආරම්භවීම</u>

- මිනිසාගේ පරිණාමය සිදු වී ඇත්තේ මහා හිම යුගයේදී ය. මීට අවුරුදු 12000 පමණ ඉහත එම මහා හිම යුගය අවසන් වන ලක්ෂණ පහළ විය. ඒවා නම්,
    - පෘථිවියේ අධික ශීතල දේශගුණය උණුසුම් බවට පත්වීම,
    - ගස්වැල් සාරවත්ව වැඩෙන්නට පටන් ගැනීම,
    - සතුන්ට ආහාර සුලබ වීම,
    - මිනිසුන්ට ද මෙම වෙනස දැනෙන්නට වීම,
- මෙම වෙනස්කම් දක්නට ලැබුණු යුගය හොලෝසීන යුගය යි.
- හොලෝසීන යුගයේදී,
    - සතුන් දඩයම් කිරීම වෙනුවට → ගොවිතැන ආරම්භ වීම
    - ගල් මෙවලම් භාවිතය වෙනුවට → ලෝහ මෙවලම් භාවිතය
    - සතුන් දඩයම් කිරීම නවතා → සතුන් හීලෑ කිරීම (සත්ත්ව පාලනය)
- පසුව බෝග වගා කටයුතු ආරම්භ විය

    වී වගාව ආරම්භය → චීනය

    තිරිඟු වගාව ආරම්භය → මධ්‍ය ධරණී ප්‍රදේශය


    බඩ ඉරිඟු වගාව → මධ්‍යම මෙක්සිකෝව

- මිනිසාගේ කටයුතුවල වර්ධනය / වෙනස

| ගොවිතැන ආරම්භය | උපකරණ තැනීම | ජනාවාස බිහිවීම | නිවාස තැනීම | විවේකය |
|---|---|---|---|---|
| (ධාන්‍ය වගාව හා සත්ත්ව පාලනය) | - මැටි උපකරණ<br>- ලෝහ උපකරණ<br>(උදලු, කැති, පොරව)<br>(උදා :- කැත්තක් ඊශ්‍රායලයෙන් සොයාගෙන ඇත) | | මැටියෙන් සාදන ලද වරිච්චි බිත්ති සහ කොළ අතු සෙවිලි කළ වහල | - චිත්‍ර ඇඳීම<br>- සංගීතය<br>- පිළිම සෑදීම |

- මිනිසාගේ කටයුතුවල වර්ධනයත් සමග ලෝකයේ ශිෂ්ටාචාර බිහිවීම ආරම්භ විය.
- මුල්ම ජීවියා ජලයේ බිහිවී පසුව ගොඩබිම පැතිර ගොස් අද වන විට
    - පක්ෂීන්
    - උරගයන්
    - මත්සයින්
    - කෘමීන්
    - පණුවන්
    - සන්ධිපාදකයින්
    - ක්ෂීරපායින් යන සියලු සතුන් අතර වානර පරම්පරාවෙන් පැමිණි හෝමෝසාපියන් නම් මානවයා

බුද්ධිමත් මිනිසා තෙක් වර්ධනය වී ඇත. එය පහත රූප සටහනෙන් පැහැදිලි වේ.



- ලෝකයේ ඇතැම් ප්‍රදේශවල හෝමෝ සාපියන් මානවයාගේ දේශගුණ විවිධත්වයන් මත හැඩරුවේ / ශරීර ලක්ෂණ වල වෙනස්කම් පවතියි.

  - අප්‍රිකාවේ - නීග්‍රොයිඩ්
  - උතුරු ඇමරිකාව, ග්‍රීන්ලන්තය, ඕස්ට්‍රේලියාව, උතුරු ආසියාව - කොකසොයිඩ්
  - ඉන්දියාව - ඔස්ට්‍රලොයිඩ්
  - නැගෙනහිර ආසියාව - මොන්ගොලොයිඩ්

**<u>ක්‍රියාකාරකම - 4</u>**

**කෙටි පිළිතුරු සපයන්න.**

1. මහා හිම යුගය අවසන් වී ගස්වැල් සරුවට වැඩුණු සතුන්ගේ ආහාර සුලභ වූ උණුසුම් කාලය හැඳින් වූ නම ක්‍රමක්ද?
2. එම කාලයේදී /යුගයේදී ඇතිවූ වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.
3. පහත වගුවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

| ධාන්‍ය වර්ග | ආරම්භ කළ රට |
|---|---|
| වී | ................................ |
| ............................................. | මධ්‍යම මෙක්සිකෝව |
| බඩ ඉරිඟු | .................................. |

4. මිනිසාගේ කටයුතු වල වෙනස්කම් සිදු වූ පහත සඳහන් අංශ ගැන වාක්‍ය 2 බැගින් ලියන්න.
   1. නිවාස තැනීම
   2. උපකරණ තැනීම
5. පහත සඳහන් හෝමෝ සාපියන් මානව වර්ග ජීවත් වන ප්‍රදේශ ලෝක ආකෘති සිතියමක සේයා කොට ළකුණු කරන්න. ( පෙළ පොත උදව් කරගන්න )

   නීග්‍රොයිඩ්, කොකසොයිඩ්, ඔස්ට්‍රලොයිඩ්, මොන්ගොලොයිඩ්